# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம
LAND COMMISSIONER GENRAL'S DEPARTMENT

නො. 07, ග්‍රෙගරි මාවත, කොළඹ -07, ශ්‍රී ලංකාව.
இல. 07இ கிரகறிஸ் மாவத்தைஇ கொழும்பு 07, இலங்கை.
No. 07 Gregory's Avenue, Colombo - 07, Sri Lanka.

ෆැක්ස් :
பெக்ஸ் : 2584051
Fax :

ඊ මේල් :
ஈ-மெயில் : landcom
Email :


මගේ අංකය :
எனது இலக்கம் :
My No : 3/සං/2/බිම්/චක්‍රලේඛ v

ඔබේ අංකය :
உமது இலக்கம் :
Your No :

දිනය / திகதி / 2009/08/ 12

01. හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්

02. රෙජිස්ට්‍රාර් ජනරාල්

**<u>ඉඩම් සංවර්ධන ආඥා පනත, ඉඩම් ප්‍රධාන (වි.වි) පනත යටතේ නිකුත් කර ඇති දීමනාපත්‍ර ඉඩම් සඳහා නිකුත් කළ හිමිකම් සහතික, සාධන පත්‍ර මගින් පැවරීම</u>**

හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හිමිකම් සහතිකයක් නිකුත් කළ රජය විසින් ප්‍රධානය කර ඇති දීමනා පත්‍ර සහිත ඉඩම් ආපසු රජයට භාර දීම කොන්දේසි සංශෝධනය, උරුම සංශෝධනය, උකස් කිරීම හා පැවරීම සම්බන්ධ ගනුදෙනු වලදී ක්‍රියාකළ යුතු ආකාරය ගැන ප්‍රාදේශීය ලේකම් වරුන් කිහිප දෙනෙකු මගෙන් උපදෙස් විමසා ඇත.

ඔබටද පිටපතක් සහිතව සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් ඇමතූ මගේ අංක 2007/3 චක්‍රලේඛය හා 2007/03 (iii) චක්‍රලේඛය මගින් ඉහත අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය මුද්‍රිත ආකෘති මා විසින් හඳුන්වා දී ඇති නිසා එම ආකෘති හිමිකම් සහතික ලබා දුන් ඉඩම් වල හිමිකම් සංශෝධනය, විකිණීම, පවරා දීම, උකස් කිරීම, අවලංගු කිරීම රජයට ආපසු භාර දීම වැනි අවස්ථා වලදී සාධන පත්‍රයක් සේ භාවිතා කිරීමට කටයුතු කිරීම සුදුසු බව යෝජනා කරමි. කරුණාකර හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ රෙගුලාසි මගින් එම ආකෘති සාධන පත්‍ර ලෙස ගැසට් කිරීමට කටයුතු කරන්නේනම් මැනවි. ඔබගේ පහසුව සඳහා එම ආකෘති මේ සමග අමුණා ඇත.

ලියාපදිංචියට එවීමේ දී එම සෑම ආකෘතියක් සමගම හිමිකම් සහතිකයද අමුණා එවන ලෙස ප්‍රාදේශීය ලේකම් වරුන්ට උපදෙස් දිය හැකි අතර එය ලියාපදිංචි කටයුතු සඳහා පහසුවක් විය හැකි බව කල්පනා කරන අතර මේ සම්බන්ධව ඉක්මන් පියවර ගන්නා මෙන්ද කාරුණිකව ඉල්ලමි.

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :
1. ලේකම් , ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.පි.
2. බිම්සවිය ක්‍රියාත්මක වන ප්‍රදේශ වල පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
3. බිම්සවිය ක්‍රියාත්මක වන ප්‍රදේශ වල සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)
4. රන්බිම ශාඛාව

(2–4) දැ.ගැ.පි.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>பொது<br>General | 2677166 | ආයතන<br>பதிவுய<br>Establishment | 2671173 | ගිණුම්<br>நிதிய<br>Accounts | 2675574 | ඉඩම්<br>காணி<br>Land | 2675576 | සංවර්ධන<br>அபிவிருத்தி<br>Development | 2677293 |